# අසල්වැසියාගේ මිනී වළ මත මාළිගා තනන සක්විතිවරු

මධුරංග දිසානායක

සිංහලයන් සැමවිටම අනුන්ගේ යහපත ගැන සිතන පතන උතුම් ජාතියකට අයත්යැයි කියනු අපි අසා ඇත්තෙමු. ඒ ඉස්සර ය. දැන් ඒ සියල්ල කනපිට හැරී ඇත . දැන් ඇත්තේ පියා හෝ සහෝදරයා මරාදමා හෝ තමාගේ මඩිය තර කරගන්නා සක්විතිලා ගේ කාලයයි. මේ සක්විතිලා ඉන්නේ ශ්‍රී ලංකාවේ පමණක් නොවේ.

සක්විති ක්‍රමවේදය පසෙක සිට නිරීක්ෂණය කරන විට දැක ගත හැකි ලක්ෂණ කීපයක්ම ඇත. ඔවුහු පළමුව සමාජයේ මර්මස්ථාන වල සිටිනා මුදලට බිලී බා ගත හැකි දුර්වලයන් සොයා ඔවුන් තමන්ගේ මුදල් බලයෙන් දැලේ දා ගනිති. මුදලට ගිජු මේ දුර්වලයන් හරහා තමන්ගේ සමාජ ස්ථාවරය ක්‍රමයෙන් ගොඩ නගා ගනිති. සමාජයේ විවිධ උත්සව වලට මුදල් විසි කරති. ඒ මුදල් බලයෙන් ඒ උත්සව වල ආරාධිත අමුත්තන් වැනි කැපී පෙනෙන භූමිකා වලට පැන ගනිති. පල්ලි පන්සල් සඳහා නිර්ලෝභීව මුදල් විසි කරති. රණවිරුවන් සඳහා පුෂ්පෝහාර පවත්වති. යුද්ධයට බියෙන් ඔස්ට්‍රේලියාවට පැනගත් බවත් යුද්ධය පැවති කාලයේ මෙල්බන් නගරයේ පැවති එල්ටීටීඊ විරෝධී එකදු උද්ඝෝෂණයකට හෝ සහභාගි නොවූ බවත් සමාජයෙන් වසන් කරන්නට මේ සක්විතිලාට හැකිය. එසේ කරන්නේ අර මා කලින් කිව් මුදලට ගිජු සමාජ ක්‍රියාකාරීන් මේ සක්විතිලා ආවරණය කරන්නට නිතරම සැදී පැහැදී සිටින බැවිනි.

ප්‍රතිරූප ගොඩ නැගීමේ සක්විති ව්‍යාපාරය එතැනින් නොනවතියි. සිය බූවලු අඬු වලින් ඩැහැ ගන්නා පොදු ගුවන් විදුලිය පවා තමන්ගේ ප්‍රචාරක යාන්ත්‍රණයට අනියමින් යොදා ගනිති.

මේ ප්‍රතිරූප ගොඩ නැගීමේ ක්‍රියාවලියේ ඊළඟ පියවර වන්නේ සිය මඩිය තරකර ගැනීමේ ක්‍රියාදාමය ආරම්භ කිරීමයි. මුදල් රැස්කර ගැනීමේ අසීමිත තන්හාවෙන් අන්ධ වී සිටින මේ සක්විතිවරු අසල්වැසියා කනත්තට දක්කා හෝ සිය මඩිය තරකරගන්නට මාන බලති. ඒ වෙනුවෙන් ඕනෑම පහත් තත්වයකට වැටෙන්නට මේ සක්විතිලාත් සක්විතිලාගේ මුදලට යටවුණ ඇම්බැට්ටයනුත් සූදානම් ය.

තමන්ගේ අතිමහත් තෘෂ්ණාව හේතුවෙන් අහිංසක මිනිසුන් හිඟමනට වැටුණාට මේ ගහලයන්ට කමක් නැත. ඒ අහිංසක මිනිසුන්ගේ දරුපවුල් මහ මගට වැටුණාට මේ ගහලයන්ට දුකක් නැත. කෙසේ හෝ තම මඩිය තරකර ගැනීම පමණක්ම ඒකායන අරමුණ කරගත් මේ සක්විතිලාත් උන්ගේ මුදලට ලොල් වී උන් වෙනුවෙන් කඩේ යන මෝඩයන් කීප දෙනාත් වෙනුවෙන් වෙනම අපායක් නිර්මාණය වනු නියත ය.

කාට හෙණ ගැහුණත් තමන්ගේ මඩිය තර වේ නම් සැනසීමට පත් වන මේ නොමිනිසුන් ගැන මේ සමාජය දැනුවත් විය යුතු ය. මේ පහත් මිනිසුන්ගේ අධාර්මික ව්‍යාපෘති සඳහා හදවතට එකඟව දායක විය හැකිදැයි ඔබත් සිතිය යුතු ය.

30 වන පිටෙන්

දේශපාලන පක්ෂ නියෝජනය වනුයේ බහුතරය මගිනි. දේශපාලන පක්ෂ නියෝජනය කරන සමහර නියෝජිතයන් තුළ මෙන්ම ඡන්ද දායකයන් තුළ ද වර්ගවාදී අදහස් තිබීම සුළු ජන කොටස් පාලන ප්‍රවාහයෙන් ගිලිහී යාමට හේතුවක් වෙයි. එසේම සුළු ජාතීන්ගේ නියෝජනයෙන් පැමිණි ජනතාවගේ සිතේ ඇඳුණු චරිත අප අතර නොමැති වීමද සුළු ජාතීන්ගේ නියෝජනය අඩු වීමට හේතුවක් වෙයි.

## පලාත් පාලනයේ කාර්යභාරය

ප්‍රජාවට ඉතා ආසන්න පාලන මට්ටම වනුයේ පලාත් පාලන ආයතනයි. තම බල ප්‍රදේශයේ වෙසෙන ජනයාගේ අවශ්‍යතා හඳුනාගෙන ඊට අනුකූලව සැළසුම් සකස් කිරීම සහ ඒවා ක්‍රියාත්මක කිරීම පලාත් පාලන ආයතන වල කාර්යභාරයයි. සංස්ඛෘතික විවිධත්වය අගය කිරීම හා විවිධ සංස්කෘතීන් අතර සහජීවනය ඇති කිරීම පලාත් පාලන ආයතන වලට පැවරී ඇති ප්‍රධාන වගකීමකි. තවත තම බල ප්‍රාද්ශයේ ජනතාවට අවශ්‍ය සේවා සැපයීමත් සෞඛ්‍ය තත්වය දියුණු කිරීම සඳහා පදනම සැකසීමත් ජනතාවගේජීවන තත්වය උසස් කිරීමත් පලාත් පාලන ආයතන වල කාර්යභාරයට ඇයත්වේ. තවද පලාතේ ආර්ථික හා ප්‍රජා සංවර්ධනයට අදාල ගැටළු හඳුනාගෙන ඊට අදාල ප්‍රතිපත්ති සැළසුම් හා ක්‍රියාමාර්ග සකස් කිරීම පලාත් පාලන ආතන මගින් සිදුවේ.

මෙල්බර්න්හි පලාත් පාලන බල ප්‍රදේශ 28ක් ඇත . පලාත් පාලාන මැතිවරණ පැවැත්වෙන්නේ වසර හතරකට වරකි. මේ සඳහා තැපැල් ඡන්දය භාවිතා කෙරේ. සෑම පලාත් පාලන ආයතනයක්ම තෝරා පත් කරගන්නා නියෝජිතයන් 5 සිට 12 දක්වා සංඛ්‍යාවකින් සමන්විත වෙයි.

## ඕස්ට්‍රේලපියානු පලාත් පාලනයේ සුළු ජාතික නියෝජනය

ඕස්ට්‍රේලියාවේ මැතිවරණය බොහෝ දුරට සාධාරණ ලෙසත ප්‍රජාතන්ත්‍රවාදී ලෙසත් පැවැත්වෙන බව අපි දනිමු. එසේ වුවද ඕස්ට්‍රේලියාවේ පලාත් පාලනය තුළ සුළු වාර්ගික කාන්තා සහ අධ්‍යාපන තත්වයෙන් අඩු සමාජ මට්ටම් නියෝජනය වීම බෙහෙවින් සීමිත වේ. සුළු ජන කොටස් පොදු ප්‍රවාහසේ සමාන ප්‍රතිලාභ ලබන කොටස්කරුවන් බවට පත්වීමට නම් ඔවුන්ගේ නියෝජනය පලාත් පාලනය තුළ බෙහෙවින් වැදගත් වේ.

පලාත්පාලනය තුළ සුළු ජන නියෝජනය සීමිත වීමට එම ප්‍රදේශ වල සුළු ජන කොටස් පැතිරී ඇති ආකාරය බෙහෙවින් බලපායි. සුළු ජන කොටස් දේශපාලනික වශයෙන් කොටස් වලට බෙදී තිබීමත් ඔවුන්ගේ නියෝජනය අඩු වීමට හේතුවකි. එමෙන්ම එක් එක් අපේක්ෂකයන් ගේ පුද්ගල ලක්ෂණ හා ප්‍රජාව සමග ඔවුන් දක්වන සබඳතා ද ඔවුන්ගේ නියෝජනය වීමට වැදගත් සාධකයකි.

බහුවාර්ගික සමාජයක කුඩා ජනකොටස් නියෝජනය සුරක්ෂිත කිරීම සඳහා යොදා ගත හැකි උපක්‍රමයක් වන්නේ සියලු දෙනා ඒකමතිකව වාද බේද දුරලා එක් නියෝජිතයකුට පක්ෂව ඡන්දය ප්‍රකාශ කිරීමයි.

ඉහත කරුණු සලකා බලන විට ඕස්ට්‍රේලියාවේ ශ්‍රී ලාංකිකයන් වැඩි වශයෙන් පැතිරී ඇති පලාත් පාලන ප්‍රදේශ වල පාලන ප්‍රවාහයට එක්වීඹට ඇති ඉඩ ප්‍රස්ථා ප්‍රයෝජනයට ගෙන ප්‍රජාව නියෝජනය කිරීම සඳහා ඉදිරිපත් වන ශ්‍රී ලාංකිකයනට උචිරිම සහය බලා දී පලාත් පාලනය තුළ ශ්‍රී ලාංකික හඬක් ඇති කිරීමට දායක වීම එක් අතකින් ශ්‍රී ලාංකිකයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමක් වන්නා සේම සමස්ථ ශ්‍රී ලාංකික ප්‍රජාව වෙනුවෙන් ඉටුකරන යුතුකමක් සහ වගකීමක් වන බවද අවසාන වශයෙන් සඳහන් කරනු කැමැත්තෙමි.

ශ්‍රියානි ජයවික්‍රම මද්දුමගේ

ශ්‍රී ලංකාවේ අමාත්‍යංශ කීපයකම උසස් තනතුරු හෙබවූ මෙම ලේඛිකාව ශ්‍රී ලංකාවේ පරිපාලන සේවයේ හිටපු නිලධාරිනියකි.

# සුභාෂිතයෙන්



මුදුවට සිනිඳු වෙඬරු ද සුදනන් හද ද
සරිකොට කිවත් කිවි දන නොම වෙය් එලෙ ද
පරනට තැව්ලි වත උනු වෙය් සුදන හද
එ ලෙසට උනු නොවෙය් එබැවින් වෙඬරු තද

ගැදි කවිය : මුදුවට
සිනිඳු හද ද
සරිකොට කිවිදන කිවත්
(ඒ) එලෙද නොම වෙය්
එරනට තැව්ලි වත
සුදන හද උනු වෙය්
(වෙඬරු) එ ලෙසට උනු නොවය්
ඔබැවින් වෙඬරු තද (වැඩිය)

(මුර්දු) මුදුදුතාව ගැන කියන විට සිනිඳු වෙඬරුත්, සුදනන්ගේ හදවතත් (හිතත්) සමාන කොට පව්කාරයන් කියන නමුත් එය එලෙස සිදු නොවේ. එය වැරදිය. අනුන්ට දුකක් සිදු වන විට සුදනන්ගේ (හදවත) සිත උනු වෙය්. වෙඬරු එසේ උනු නොවේ. එබැවින් වෙඬරු තද වැඩිය.

වෙඬරු යනු (Butter) බටර බව කියති. අපි ඒ සඳහා අදට ගැලපෙන පහසු වචනයක් හදා ගනිමු. ( Butter = බට) බටර - බටරු යන වචනය ඒ සඳහා බාවිතා කල හැකිය.

ඉංගිරිසියේ "(Heart) හාට්" සඳහා අප බාවිතා කරන්නේ හද - හදවත - ලය වැනි වචනය්. හදවතත් සිතත්, අතර තද බැඳීමක් ඇතත් සිතත් හදවතත් එකක් නොවේ; එකකි - චිත්ත වේග (සිතේ ඇතිවන කැලඹිලි) අනුව හදවතේ ගැස්ම අඩු වැඩි වන්නේ ඒ නිසාය. අප නිv ගන්නා විට සිත (මනස - මොලය) ද නිඳා ගනී.

එහෙත් හදවත නොනිඳා පන ගසමින් පවතී. වැරදිලා වත් හදවතට නින්ද ගියොත් උදේ නැගිටීම නම් බොරු. දුකේදී සමහරුන් නලලට හෝ ඔලුවට ගසා ගන්නේත්, තවත් සමහරුන් පපුවට ගසා ගන්නේත් හිත එතන ඇතැය් සිතන නිසා විය යුතුය.

ගොඩට ගත් කැස්බා දුක නිසා තම අත් - පත් දෙකින් පපුවට ගසා ගන්නා බව එක්තරා බන දෙසුමක දී කියනු මම අසා සිටියෙමි. ගැලවී යෑම සඳහා කැස්බෑවාට කල හැක්කේ අත් - පත් දෙකත් පා - පත් දෙකත් වැනීමය. එවිට අත් - පත් දෙක වැදෙන්නේ පපුවටය්; පිටට නොවේ.

මේ කිවින්දා සමහර කවිකාරයන්ගේ අදහස නො පිලිගනී. මම මේ කිවින්දාගේ අදහස නොපිලිගනිමි. රස්නය අනුව බටරුවේ තදය හෝ මෙලෙක වෙනස් වේ. "පරනට තැව්ලි වත" යන කියමනට අනුව නම් හොරකුට පාහරයකුට මිනීමරුවකුට තැව්ලක් වන විට ද සුදන සිත (හද) උනු වේ. එසේ වෙතොත් සුනනාත් ඒ ගොඩටම දැමිය යුතුය.

වෙඬරු (බටරු) මොලොක් (මෙලෙක්) ද ? සිනිඳු (ඇඳුමක්) යනු මොලොක් ද ? සිතා බලන්න.

එක් ම කවියේ දෙපලක ලෙද / ලෙස යොදා ඇත්තේ එලිවැට රැකීම සඳහාය.

හදවත (සිත) උනුවීම යනු සිත කම්පාවීමය. එහෙත් හදවත (සිත) සීතල වන්නේ කෝපය නිසා නොවේ. ප්‍රානය නිරුදද වීම නිසාය.

වි. ක. ධර්මබන්ධු